පාසැල ඇරී, ළමුන් ක්‍රීඩා භූමියේ පන්දු ක්‍රීඩා කරමින් සිටී. ස්ටැන්ලි සර්, ළමුන් ක්‍රීඩා කරන ආකාරය බලා සිටී. අසල පිහිටි, සුදු අරලිය ගස පාමුල අචලාත්, විමුක්තිත්, අනාගත ජීවිතය අවසන් තීරණයකට එළඹීමට වාඩි වී සිටි.

"අද නම් අපි තීරණයකට එන්ටම ඕනෑ විමුක්ති. මේ විදියට කාලය නාස්ති කරන එකේ තේරුමක් නැහැ. මට ගෙදරින් එන යෝජනා කෙළවරක් නැහැ. මේ කිසි දේකට මම කැමැත්ත පල කරලා නැහැ. අම්මාත්, තාත්තාත් හරිම කේන්තියෙන් ඉන්නේ. මට අදම ස්ථිර වචනයක් දෙන්ට විමුක්ති."

"අචලා, මේ ප්‍රශ්නයේදී, මම හරි අසරණයි. මේ සම්බන්ධයට ගෙදරින් කොහෙත්ම කැමති නැහැ. මට මගේ දෙමව්පියන්ට විරුද්ධ වෙලා ඔයාව බඳින්න බැහැ අචලා. හැමදාම තනිකඩව හිටියත්. ඒ අයට විරුද්ධ වෙන්ට මට බැහැ. මට සමාවන්ට. මම කවදාවත් හිතුවෙ නැහැ, මේ සම්බන්ධයට ගෙදරින් මෙච්චර විරුද්ධ වෙයි කියලා."

අචලා කිසිවක් නොදොඩා, ඈත අහස දෙස බලා සිටියාය. නීල දෙනෙතින් කඩා හැලෙන, මුතුවන් කඳුළු දෙස, විමුක්ති බලා සිටියේ, හද වාවාගත නොහැකි සංවේගයකින්. අචලා අරලිය ගස මුලින් නැගී සිටියාය. සිය දෙනෙත් පිසදමා, කිසිවක් නොදොඩා පාර දෙසට පියමං කළාය. ඇය මේ සම්බන්ධව තව තවත් පෙරැත්ත නොකලේ, කිසිදා ස්ථිර පිළිතුරක් ඔහුගෙන් නොලැබෙන බව ඇයට වැටහුනු නිසාය.

කාලය ගෙවී යද්දී, අචලාත් විමුක්තිත් අතර තිබු ඉතා කිට්ටු සබැඳියාව ටිකෙන් ටික ඈත් විය. එකම පාසලේ ගුරු සේවයේ යෙදී සිටීම තව දුරටත් අපහසු බව විමුක්ති තේරුම් ගත්තේය. අචලා දකින මොහොතක් පසා, ඔහුගේ සිත ශෝකයෙන් වැලපෙයි. පාසලේ ඉගැන්වීම් කටයුතුවලටද මෙය බාදාවක් වන බව සමහර අවස්ථාවලදී විදුහල්පතිතුමාගේ විවේචන වලදී ඔහුට තේරුම් ගියේය. විමුක්ති නිවසේදී තම දෙමාපියන් සමඟ පෙර සේ සතුටු සාමීචියට නොගියේය. කාමරය තුලට වී ඇඳ මත දිගාවී නිදැල්ලේ ගත කරයි. දෙමව්පියන්ට දුකක් වුවත්, ඔවුන් ප්‍රශ්නය දැන සිටි හෙයින් ඒ ගැන කිසිවක් ඔහුගෙන් විචාලේ නැත.

මාස කිහිපයක් ඇවෑමෙන්, විමුක්ති වෙනත් පාසලකට මාරුවක් ලබා ගත්තේය. ඔහු යන වග අචලාට දැනුම් දුන්නේද නැත.

මිශ්‍ර පාසලක ඉගැනුම ලැබූ අචලා සහ විමුක්තිගේ සම්බන්ධතාවය ආරම්භ වූයේ අටවැනි වසරේ සිටය. මුලදී දෙදෙනාට දෙදෙනා ඉතාමත් කුළුපගව සිටියත්, ප්‍රේම සම්බන්ධතාවයක් හට ගැනුනේ අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයේ ප්‍රතිපල නිකුත්වීමෙන් අනතුරුවය. දෙදෙනා එකම පාසලේ උසස් පෙළ




විෂයන් හැදෑරුවෝය. මේ දෙදෙනා ආදර සම්බන්ධතාවය දලුලන්න පටන් ගත්තේ, මේ කාල පරිච්ඡේදය තුළදීය.

වසර කිහිපයකට පසු අචලා දැනට සේවය කරන පාසලේ, විද්‍යා ගුරුවරියක් හැටියට පත්වීමක් ලබා ගත්තාය. ඊට වසරකට පසු විමුක්තිද, මෙම පාසලේම පත්වීමක් ලබා ගත්තේය. දෙදෙනා අතර තිබූ ප්‍රේම සම්බන්ධතාවය මේ වන විටත් පලුදු වී තිබුනේ නැත. අචලාට තම නිවසින් ගෙනෙන ලද මංගල යෝජනා ඇයගේ සිතට මහත් අසහනයක් විය. මේ ගැන විමුක්තිට බොහෝ වාරයක් පැවසූ මුත්, ඔහුගෙන් ඇයට කිසිම සහනදායක පිළිතුරක් ලැබුනේ නැත.

එදා හවස් යාමයේ පාසල් ක්‍රීඩා භූමියේ, අරලිය ගස් සෙවනට පැමිණියේ, අද නම් අවසන් තීරණයකට එනවා යන දැඩි අධිෂ්ඨානය අචලාගේ සිත තුල ඇති කර ගනිමින්ය.

අචලාගේ පියා විශ්‍රාමලත් විදුහල්පති තුමෙකි. මව ඉංග්‍රීසි පුහුණු ගුරුවරියකි. පවුලේ වැඩිමහල් දියණිය අචලා වූ අතර එකම නැගෙණිය "සයුරි" රජයේ රෝහලක හෙදියකි. පවුලේ සොයුරියයෝ දෙදෙනා සුරූපි බව දායාදය කොට ගත්තෝ වෙති. සිහින් ශරීරයත් දිගු කේෂ කළාපයත් නිසා සයුරිට වඩා අචලාගේ පියකරු බව වැඩි විය. සයුරි රජයේ වැදගත් පවුලක එකම පුත් රංගන සමඟ සම්බන්ධතාවයක් ඇතිකරගෙන සිටින්නීය. පවුලේ උදවිය මේ ගැන දන්නා බැවින් ඒ සම්බන්ධතාවයට කිසිම අවහිරයක් ඇති වූයේ නැත. අචලාගේ සම්බන්ධතාවය දැන සිටියේ නැගණිය පමණි. විමුක්තිගේ ගෙදර උදවියද මේ සම්බන්ධතාව ගැන ආරංචි වූ මොහොතේ සිට තමන්ගේ අකමැත්ත පල කලෝය. එකම පුතු වශයෙන් විමුක්ති සෑම විටම දෙමව්පියන් අභිබවා නොගියේය. හද තුල ශෝකය දරාගෙන, දෙමව්පියන්ට අවනත භාවය පල කර සිටීම ඔහුගේ ගුණය විය.

විමුක්තිගේ පියා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ උසස් නිළධාරියෙක් වන අතර මව අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිළධාරිනියකි. මේ දෙදෙනාම විශ්‍රම සුවයෙන් පසුවන්නෝය. විශාල දේපලකට හිමිකම් දරන මේ අය සමාජයේ උසස් ලෙස පිළිගත් අය වූවෝය.

මේ කාලසිමාවේදී, අචලාගේ නිවසට යෝජිත මනමාලයින් කිහිපදෙනකේ පැමිණියත්, මේ සම්බන්ධව තිරණ ගත්තේ නැගෙණිය සයුරිය. "අනේ අක්කේ එයා හරි නැහැ උස වැඩියි", "එයා හරි නැහැ අහංකාර පාටයි." මෙවන් සුළු සුළු අඩුපාඩු කම් පෙන්වමින්, ඒ සියල්ල මග හරවා දැමීමට අය ප්‍රධාන වූවාය.
මේ අතර තුර රංගන ගෙනා යෝජනාවකට දෙමාපියන් සතුට පළකර සිටියෝය. යෝජිත මනමාල මහතා රත්නපුර වෛද්‍යවරයෙකි. තමන්ගේ පළමු පත්වීම, රත්නපුර රෝහලට ලැබීම ඔහුට භාග්‍යයක් විය. ඔහුගේ ගම් පෙදෙස වූයේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඇලපාත නම් ප්‍රදේශයයි.

එදින සෙනසුරාදාවක් විය. අචලාගේ නිවස ඉතා අලංකාර ලෙස අස් පස් කර තිබුණි. සුදු වැලි අතුරා තිබූ මිදුල, සයුරි විසින් ඉතා අලංකාර ලෙස ඇමද තිබුණෝය. ඉතාම කිට්ටු ඥාතීන් හත් අට දෙනෙක් පැමිණ සිටියෝය.

මේ සියල්ලෝම, ලැහැස්තිව සිටියේ, රත්නපුර සිට පැමිණෙන "වේරගොඩ" පවිල පළිගැනීමටයි. දහවල් දහයට පමණ වේරගොඩ පවිල සම්ප්‍රාප්ත විය. "කපිල" වේරගොඩ තම දෙමාපියන් පසුපස ගමන් කරමින් නිවස ඉදිරියට යන අතර, අචලාගේ දෙමව්පියන් ඔවුන් සාදරයෙන් පිළිගත්තේය.

සිහින් සිරුරකින් යුත් කපිල කඩවසම් තරුණයෙකි. ප්‍රසන්නය. පෙනුමකින් යුක්තය.

පව්ලේ එකම දරුවාය. මේ අතර සයුරු වේගයෙන් අචලා සිටි කාමරයට කඩා වැදුනේය. "අපේ අක්කේ හරියට නලුවෙක් වගේ ලස්සනයි. හරිම ප්‍රසන්න පෙනුමක් තියෙනවා, මේකනම් හරියනවාමයි." කියමිනි. "කෑ නොගහ ඉන්න නංගි, පිං පෙනුමින් මිනිසුන් මනින්ට බැහැ."

එදා වේරගොඩ පවිල පිටවී ගියේ, ඉතාමත් සතුටින්ය. අචලා සහ කපිල වචන කිහිපයක් හුවමාරු කරගත්තත්, දෙදෙනා තුළම ඇති වූ ආදර හැඟීමක් ඇතිවය. මේ පැමිණීමෙන් පසු, කපිල නිතර දුරකථනයෙන් අචලා හා කතා කළේය. කපිලගේ දුරකථන ඇමතුමක් බලාපොරොත්තුවෙන් සිටි අචලාට තමන් බලාපොරොත්තු නොවූ පුද්ගලයෙකුගෙන් ඇමතුමක් ලැබිනි. කිසිසේත් බලාපොරොත්තු නොවූ මේ ඇමතුමින්, ඇගේ සිත මෙන්ම ගතද සසල වී ගියේය. ඇය තාමත් රිසිවරය කනටම ලංකරගෙන සිටි.

"විමුක්ති මම ඔයාව අමතක කලේ එදා අරලිය ගහ යටදීයි. මට තවත් කතා කරන්ට නම් එපා. මම ලගදි කසාද බඳිනවා, ඔයාට ගැලපෙන කෙනෙක් හොයා ගන්න. මීට පස්සෙ මට කතා කරන්න එපා."

විමුක්තිගේ මව හා පියා එංගලන්ත චාරිකාවකදී හදිසි අනතුරකින් මියගිය බවත්, ඔහු දැන් තනි වී සිටින බවත් ඔහුට අචලාව අමතක කරන්න බැරි බවත් ඔහු පැවසූ අන්දම අචලා මෙනෙහි කළාය. මේ සිද්ධිය අමතක කර දැමීමට අචලා දැඩිව තීරනය කළාය. මේ වග කිසිවකුට නොකියා සිටීමට ඇය අධිෂ්ඨාන කළාය. විමුක්ති කෙරෙහි දැඩි අනුකම්පාවක් අචලාගේ සිතට දැනුනාය. එහෙත් දැන් ඇයට කරන්නට දෙයක් නැත. ඇයට කෙසේවත් කපිල අත හැරීමට බැරිය. ඇය මේ සිද්ධිය අමතක කර දැමීමට වෙහෙස ගත්තාය.

දෙමාපියන්ගේ අභාග්‍ය සම්පන්න වියෝවීම, විමුක්තිගේ සිතට වැදුනු බලවත් පහරක් විය. කුඩා කල සිට විමුක්ති තම මවටත් පියාටත් දැක්වූයේ අසීමිත ආදරයකි. අචලා හා ප්‍රේම සම්බන්ධතාවය ඇති කර ගනිද්දී, ඔහු නිකමටවත් තම දෙමාපියන් මෙයට විරුද්ධ වේ යැයි සිතුවේ නැත. ඔහු, අචලා රැවැට්ටුවා නොවේ.

ඔහු කළ එකම වරද, මේ සම්බන්ධතාවය පටන් ගැනීමේදී තම වැඩිහිටියන්ගේ කැමැත්ත දැන නොගැනීමයය.

**සුචි විජේසිංහ**

සියල්ල නොසිතූ ලෙස සිදු වී ඇති නිසා විමුක්තිගේ සිත සාදා ගැනීම පහසු කාර්යක් නොවීය. අචලාට තවත් කතා කිරීමෙන් පලක් නොවන බවත්, තමාගේ සිතට දැනෙන වේදනාව තමාම විඳගත යුතු බවත් ඔහු වටහා ගත්තේය.

ඊට මාස කිහිපයකට පසු කපිල හා අචලාගේ විවාහය සිදුවිය. අචලා රත්නපුර නිවසට පදිංචියට ගියාය. මේ දෙදෙනා ඉතාමත් ආදරයෙන්, ඔවුනොවුන් අදහස් දැනගෙන ප්‍රීතියෙන් කාලය ගත කලෝය. කපිල ඉතාමත් කරුණාබර සැමියෙකි. අචලාගේ ඕනෑ එපා කම් සියල්ල සොයා බලා ඇය සතුටින් තැබීම ඔහු සතු යුතුකමක් ලෙස සැලකුවේය. කපිල සතු මේ ලයාන්විත ගුණය අචලා අගය කළාය.

මේ අතර තුර හිදැල්ලන ප්‍රදේශයේදී සිදුවු මෝටරථ අනතුරකින් තරුණයින් හත් අට දෙනෙකු රත්නපුර මහා රෝහලට ගෙනෙනු ලැබුවේය. නොසිතූ වේලාවක පැමිණි මෙම ආරංචිය නිසා වෛද්‍ය කපිල මහතාට වහාම රෝහලට යෑමට සිදුවිය. මේ තරුණයින්ගෙන් දෙදෙනෙක් රෝහලට ගෙන ඒමට ප්‍රථම මරණයට පත්විය.

කපිල නැවත ගෙදර පැමිණෙන විට පාන්දර හතරට පමණ ඇත. මේ වන විට අචලා අඩ නින්දේ පසුවුවාය. ඇය කපිල එනතුරු බලා සිටියාය. කපිල කාමරයට ගොඩ වැදුනේ " ඔයාගේ ගමේ කෙනෙකුත් බරපතල විදියට තුවාල වෙලා, මිනිහගේ ජිවිතයට අනතුරක් නම් නැහ.. ඒ වුනත් කකුලේ තත්වය බරපතලයි."

"ඒ කවුද කපිල ඔයාට වගතුග මතකද?"

"මිනිහා ගුරුවරයෙක්ලු.. නම හරියට මතක නැහැ"

ගුරුවරයෙක් බව ඇසීමෙන් අචලාගේ සිත මඳක් චංචල වුවත් ඒ ඔහු වන්නට බැරි බව ඈ සිතුවාය.

කපිල නැවත ගෙදර එනතුරු අචලා නොඉවසිල්ලෙන් බලා සිටියේ තම ගමේ අනතුරට පත් වු ගුරුවරයා කව්ද යන වග දැන ගැනීමටය. එහෙත් එකවරම කපිලගෙන් මෙය ඇසිය නොහැක. කොයි වේලේ හෝ ඔහුගේ කටින්ම මෙය පිටවනතුරු අචලා බලාසිටියාය.

අචලා දැන් මවක් වීමට ආසන්නය. තව මාස කිහිපයකින් ඇය දරු සුරතල් බලන මවකි. ගෙදර වැඩපල වලට උදව් වන "මැණිකේ" අචලාගේ සැප දුක් බලා ගන්නීය. වැඩිහිටි කාන්තාවක් වු මැණිකේ, අචලාට මවක් මෙනි.

එදා කපිල පැමිණියේ රාත්‍රි හතට පමණය. පුරුදු ලෙස




